# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2024 ජූනි 18 |


## ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹෙයි.

මුදල් විශුද්ධිකරණය, අල්ලස් හෝ දූෂණ සහ ඒ ආශ්‍රිත අපරාධ පිළිබඳ විමර්ශන සහ නඩු පැවරීම් සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹිණි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් එහි කොමසාරිස්වරයෙකු වන ජනාධිපති නීතිඥ චේතිය ගුණසේකර මහතා සහ අධ්‍යක්ෂ ජනරාල් කනිෂ්ක විජේරත්න මහතා ද, මූල්‍ය බුද්ධි ඒකකය වෙනුවෙන් එහි අධ්‍යක්ෂ ආචාර්ය සුභානි කීර්තිරත්න මහත්මිය ද අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා මෙම අවස්ථාවේ මුලසුන හෙබවීය. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්ය සාධක බලකායේ සාමාජිකාවක් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති කේ. ඒ. එම්. එන්. දවුලගල මහත්මිය ද මෙම අවස්ථාවට සහභාගී විය.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මගින් යම් විමර්ශනයකට අදාළ තොරතුරු යම් දේශීය නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ වෙනත් යම් රජයේ අධිකාරියක් සමඟ හුවමාරු කර ගැනීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත බලය ලබා දී ඇත. එසේම, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකයට යම් දේශීය රාජ්‍ය ආයතනයක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹිය හැකිය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ මූල්‍ය බුද්ධි ඒකකය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම මගින් මුදල් විශුද්ධිකරණය, අල්ලස් හෝ දූෂණ, සහ ඒ ආශ්‍රිත අපරාධ කටයුතු වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ එම වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කර නඩු පැවරීම සඳහා අත්‍යවශ්‍ය වන තොරතුරු හුවමාරු කර ගැනීමට හැකියාව ලැබේ.

මෙරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමේ අරමුණින් මූල්‍ය බුද්ධි ඒකකය, 2008 වසරේ සිට මේ දක්වා විදේශීය පාර්ශ්ව 44 ක් සමග මෙන්ම ශ්‍රී ලංකා රේගුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු තවත් දේශීය රාජ්‍ය ආයතන 13 ක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹ ඇත.



මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය සුභානි කීර්තිරත්න මහත්මිය සහ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් කනිෂ්ක විජේරත්න මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති / මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු වන ජනාධිපති නීතිඥ චේතිය ගුණසේකර මහතා ඉදිරියේ දී අවබෝධතා ගිවිසුම හුවමාරු කරන අවස්ථාව.